055289
ML/PR
2017/09/08



# ශ්‍රී ලාංකේය නර්තන කලාවේ රංගාලෝකකරණ භාවිතය

055289

# නිබන්ධ සාරංශය


ශ්‍රී ලාංකේය කලා ක්ෂේත්‍රයෙහි රංගාලෝකකරණය පිළිබඳ ව නිශ්චිත නිර්වචනයක් නොමැති අතර ඒ පිළිබඳ ව ශාස්ත්‍රීය පර්යේෂණ දක්නට නොලැබෙයි. එමෙන් ම නර්තන ක්ෂේත්‍රයට ගැලපෙන පරිදි රංගාලෝකකරණ ක්‍රම විධීන් සහ න්‍යායයන් නිර්මාණය වී නැති අතර රංගාලෝකකරණ උපකරණ සහ තාක්ෂණය පිළිබඳ ව නව දැනුම බොහෝ කලාකරුවන් අතර නොමැත. ඒ සඳහා සිංහලයෙන් රංගාලෝකකරණය සඳහා ලියවූ පොතපත සොයා ගැනීම අසීරු ය. රංගාලෝකකරණය පිළිබඳ ව පරිවර්තන හෝ සිදු නොවන්නේ ප්‍රායෝගිකත්වයට තදින් බරවූ විෂයයක් හුදු පර්වර්තනයකින් සාර්ථක නොවන නිසාවෙන් බව සිතමි. එමෙන් ම, එවැනි ග්‍රන්ථයක් රචනා කිරීමට ප්‍රායෝගික භාවිතාව පිළිබඳ ව වූ දැනීම අවශ්‍ය වෙයි.

එබැවින් මෙම පර්යේෂණ නිබන්ධය සම්පාදනය කිරීමේ දී පළමුවැනි පරිච්ඡේදයෙන් ආලෝකය යන සිංහල වචනය භාවිත වන ක්ෂේත්‍රයන් පර්යේෂණයට යොමුවන අතර ආලෝකය යන වචනයට ලබාදෙන අර්ථ පිළිබඳ ව ද අවධානයට ලක් වෙයි. එමෙන් ම රංගාලෝකකරණය යන්න නිර්වචනය කිරීම සිදුවන අතර එයට උචිත නිශ්චිත ඉංග්‍රීසි වචනයක් පිළිබඳ ව සාකච්ඡාවට ලක් වෙයි.

දෙවැනි පරිච්ඡේදයෙන් රංගාලෝකකරණයේ විකාශය පිළිබඳ ව සහ භාවිත පහන් වර්ග සාකච්ඡාවට ලක් වෙයි. එමෙන් ම රංගාලෝකකරණ ක්ෂේත්‍රයේ භාවිත ආලෝක උපකරණ සඳහා නිශ්චිත අර්ථ ගැන්වීමක් සිදු නොවන අතර ඒ සඳහා සිංහල අර්ථයක් ලබා දීම සිදු වෙයි. තවද, නවීන ආලෝක පහන් සහ එහි ක්‍රියාකාරීත්වයන් අවධානයට යොමු වන අතර නර්තන ක්ෂේත්‍රයට උචිත පහන් වර්ග පිළිබඳ ව සාකච්ඡාවට ලක් වෙයි.

නර්තනය පිළිබඳ ව විවිධ අර්ථයන් දක්නට ලැබෙන අතර ශ්‍රී ලාංකේය නර්තන කලාව පිළිබඳ ව තුන්වැනි පරිච්ඡේදයෙන් අවධානයට ලක් වෙයි. එම නර්තනයන්හි අතීත භාවිත රංගාලෝකකරණ ශිල්ප ක්‍රම පිළිබඳ ව අවධානයට ලක්වෙයි.

හතරවැනි පරිච්ඡේදයෙන් ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ප්‍රගමනය සඳහා රංගාලෝකකරණය සිදු කළ හැකි ආකාරය පිළිබඳව යෝජනාවලියක් ඉදිරිපත් කරයි. එහි දී රංගාලෝකකරණ සැළසුම් කීපයක් ඉදිරිපත් කරන අතර අවම ආලෝක පහන් මගින් රංගාලෝකකරණයක් සිදු කළ හැකි ආකාරය පිළිබඳ ව ද සාකච්ඡාවට ලක් වෙයි.

රංගාලෝකකරණයක් සිදු කිරීමේ දී සැළකිලිමත් විය යුතු කරුණු පිළිබඳ ව පස්වැනි පරිච්ඡේදයෙන් ඉදිරිපත් කරයි. එහි දි නර්තන නිර්මාණ ශිල්පියා මෙන් ම රංගාලෝකකරණ ශිල්පියා අවධානයට ලක් කළ යුතු කරුණු ද සාකච්ඡාවට ලක් වෙයි. වෙසෙසින් වත්මන් ප්‍රොසීනියම් වේදිකාවේ මතවාදයන්ට ලක්වෙන ස්ථාවර උපකරණ සහ වේදිකාවේ කොටස් පිළිබඳ ව නව අදහස් කීපයක් ඉදිරිපත් කරයි.

හයවැනි පරිච්ඡේදයෙන් නර්තනය සඳහා නව රංගාලෝකකරණ සැළසුමක් ඉදිරිපත් කරයි. එය නර්තනය, නාට්‍ය කලාව සහ මුද්‍රා නාට්‍ය යන කලා අංග සඳහා ද භාවිත කිරීමට සුදුසු පරිදි යෝජිත වෙයි.